## I.0 හැඳින්වීම.

වර්තමානය වන විට අප රටේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල් වල අපරටේ ආරක්ෂක හමුදාවන්ගේ විශිෂ්ටත්වය ගැන නිරතුරුව කතාබහට ලක් වෙමින් පවතී. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව යුද, ගුවන් , නාවික වූ ත්‍රිවිධ අංශයන්ගෙන් සමන්විතය.දශක තුනකටත් වැඩි කාලයක් පුරාවට අප රට තුළ පැවැති දරුණු යුද වාතාවරණය සහමුලින්ම තුරන් කිරීමට අප රටේ ආරක්ෂක හමුදාවන්ට හැකි විය. කොටි ත්‍රස්තවාදීන්ගේ කුරිරු ක්‍රියා නිසා බියෙන් තම එදිනෙදා කටයුතු කළ සාමාන්‍ය ජනතාවට නිදහසේ තම දෛනික කටයුතු කරගෙන යාමට අවස්ථාව සලසා දීමට අප රටේ ආරක්ෂක හමුදාවන්ට හැකි විය. එපමණක් නොව කොටි ත්‍රස්තවාදීන් යටතේ එළිමහන් සිරකඳවුරක බඳු ජීවිතයක් ගෙවූ අපගේ දෙමළ ජනතාව එම එළිමහන් සිර කඳවුරෙන් මුදවාගන්නට ඔවුහු සමත් වූහ. එසේම තම තාරුණ්‍යය රටේ අනාගතය වෙනුවෙන් කැපකරමින් දිය ගොඩ ගුවන ආරක්ෂා කිරීමට ඔවුහු නිරතුරුව කැපවී ක්‍රියා කරති. අගනුවර අවට මෙන්ම දරුණු යුද ගැටුම් පවතින ක්‍රියාන්විත ප්‍රදේශවල , මහ වනාන්තර , මහ සයුර මැද දිවා රෑ නොබලා මේ මොහොත වන විටත් ලක්ෂයකට අධික වූ ආරක්ෂක හමුදා සාමාජිකයෝ පිරිසක් තම රාජකාරී කටයුතුවල යෙදෙමින් සිටිති.

සිව්වන ඊළම් යුද සමයේදී වැඩි වශයෙන් මුද්‍රිත මෙන්ම විද්‍යුත් මාධ්‍ය මඟින් ද යුද ජයග්‍රහණ ගැන නිරතුරුව කතාබහ කෙරුණි.එහිදී ආරක්ෂක හමුදා රණවිරුවන්ගේ චිත්ත ධෛර්යය, මානසිකත්වය වර්ධනය නව ආකාරයේ වැඩසටහන් බොහෝ ප්‍රමාණයක් මාධ්‍ය මුල් කොට ගෙන නිර්මාණය විය.ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ සේවය ඇගයීම , සේවයට ආධුනිකයන් බඳවා ගැනීම ආදී වූ නිර්මාණාත්මක දැන්වීම් , ලබා ගත්තා යුද ජයග්‍රහණ ආදිය මෙන්ම ආරක්ෂක හමුදා රණවිරුවන් වෙනුවෙන් ඔවුන්ට සජීවීව රණබිමේ, කඳවුරේ සිට සම්බන්ධ විය හැකි ආකාරයේ වැඩසටහන් මාධ්‍ය හරහා බිහි විය.

අනෙකුත් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන්ට සාපේක්ෂව ආරක්ෂාව හමුදාවන් උදෙසා ප්‍රවෘත්ති හා විශේෂාංග වැඩසටහන් වැඩි වශයෙන් ගුවන් විදුලි මාධ්‍යය හරහා ප්‍රචාරය වෙයි. එයට ප්‍රධානතම හේතුව ආරක්ෂක හමුදාවන්ට සංකීර්ණ ක්‍රියාකාරීත්වයකින් තොරව ගුවන් විදුලිය භාවිත කිරීමට ඇති ශක්‍යතාවයි. වර්තමානය වන විට සෑම ගුවන් විදුලි නාලිකාවකම දිනකට පැය දෙක තුනක ගුවන් කාලයක් ආරක්ෂක හමුදා රණවිරුවන් වෙනුවෙන් වෙන් කර ඇත්තේ ද ඔවුන්ට සම්බන්ධ වීමට වැඩි අවකාශයක් ලැබෙන මාධ්‍යය ගුවන් විදුලිය බැවිනි.

" Radio is every where. Sets are common in the bed room. ( Where they put people to sleep and wake them up ) in kitchens , in cars , in offices , on city streets , on beaches , at ball games and in a doze other places " (Dominic, R. 1994:P 98)

තරාතිරමක් තැනක් නොතැනක් නොබලා ගමන් කිරීමේ හැකියාව ගුවන් විදුලි මාධ්‍යට ඇත. භූගෝලීය සීමාවන් ඉක්මවා යන ගුවන් විදුලිය පහසුවෙන් එහා මෙහා රැගෙන යා හැකි ජංගම මාධ්‍යයකි.

මේ වනවිට අපරට තුළ ජනමාධ්‍යයන් බොහෝ ප්‍රමාණයක් පැවතියත් ජනතාව අතර ගුවන් විදුලිය ප්‍රමුඛස්ථානය ගෙන සිටියි. විශේෂයෙන් ආරක්ෂක හමුදාවන්ට පහසුවෙන් හා සමීපව ගුවන් විදුලි මාධ්‍ය භාවිත කළ හැක්කේ මේ හේතුන් නිසාය. මුද්‍රිත මාධ්‍යයන් අතරින් පුවත් පත් කියවීමට ආරක්ෂක හමුදාවන්ට ලැබෙන අවස්ථා ඉතාමත් අවමය. එසේම රූපවාහිනිය භාවිතය ද සංකීර්ණය. විශේෂයෙන්ම දුෂ්කර ක්‍රියාන්විත ප්‍රදේශ වල රාජකාරී කරන පිරිසට තම පාළුව , තනිකම නිවන සඟයා බවට පත්වඇත්තේ ගුවන් විදුලියයි.ජංගම දුරකථන හරහා ගුවන් විදුලියට සවන් දීමේ ඇති හැකියාව නිසා බොහෝ ආරක්ෂක හමුදා සාමාජිකයන් පිරිසක් ගුවන් විදුලි ග්‍රාහකයන් බවට පත් වී ඇත. එසේම ගුවන් විදුලි මාධ්‍යය කෙරෙහි සාක්ෂරතාවේ බලපෑමක් නැත. ආරක්ෂක හමුදා සාමාජිකයන් අතර සාක්ෂරතාව විවිධය. නමුත් මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍ය ඇසුරු කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාවයි. ආරක්ෂක හමුදාවන්ගෙන් බොහෝ පිරිසක් ගම්බද සාමාන්‍ය පවුල් වල පිරිසය. මේ නිසාත් තම රුචි අරුචිකම් වලට භාවිත කළ හැකි මාධ්‍යය වන්නේ ගුවන් විදුලියයි.

ගුවන් විදුලි නාලිකා හරහා නිරතුරුව ගීත ප්‍රචාරය කිරීම මෙන්ම ක්‍රිකට් විස්තර විචාර ඉදිරිපත් කරන නිසාත් ගුවන් විදුලිය මාධ්‍යයන්ට ආරක්ෂක හමුදාව සමීප වෙයි.

තමන්ටහැකි ඉඩ කඩ ලැබෙන බොහෝ අවස්ථාවල ඔවුහු ගුවන් විදුලි මාධ්‍යය සවන් දෙන ආකාරය ගුවන් විදුලි සජීවී වැඩසටහන් වලට දුරකථන මඟින් සම්බන්ධ වී ගීත ඉල්ලීම් අදහස් දැක්වීම් මඟින් කරන සහභාගිත්වයෙන් වැටහේ. වර්තමාන බොහෝ ගුවන් විදුලි නාලිකා පැයක් ආරම්භයේ දී ඉදිරිපත් කරයි. එසේම හිරු Fm නාලිකාවේ "බංකරය" සිරස Fm හි "මුර අඩවිය" නෙත් Fm හි "විරු සංදේශය" සත් Fm හි "රණ බිමට සත්" ආදි රණවිරුවන් උදෙසාම නිර්මාණය වන වැඩ සටහන් දැකිය හැක.

ආරක්ෂක හමුදාවන්ට අනෙකුත් මාධ්‍යන්ට සාපේක්ෂව ගුවන් විදුලි මාධ්‍යයට සක්‍රියව සහභාගී වීමට ඇති ශක්‍යතාවය ඉහළ නිසා ආරක්ෂක හමුදාවන් ගැන , ඔවුන්ගේ රුචි අරුචිකම්වල අනුව නානාවිධ ගුවන් විදුලි වැඩසටහන් මෙම වසර තුළ ගුවන් විදුලි මාධ්‍යය මුල් කොට ගෙන බිහි විය.